කාන්තා අයිතිවාසිකම් කප්පාදු කළ සන්ධාන ආණ්ඩුව මෙම මහ මැතිවරණයේදී අමතක කර දමා එක්සත් ජාතික පෙරමුණ ජයග්‍රහණය කරවා කාන්තා අයිතිවාසිකම් ආරක්‍ෂා කර ගනිමු යැයි එක්සත් ජාතික පෙරමුණේ නායක සහ විපක්‍ෂනායක රනිල් වික්‍රමසිංහ මහතා එක්සත් ජාතික පක්‍ෂයේ දිගාමඩුල්ල දිස්ත්‍රික් බල මණ්ඩලය අමතමින් ඉකුත් 08 වැනි දා (ලෝක කාන්තා දිනය දා) පැවසීය.

මහින්ද චින්තනය කාන්තාවන් අමතක කර දැමුව ද එක්සත් ජාතික පෙරමුණ කාන්තාවන් අමතක නොකරන බව කී විපක්‍ෂනායකවරයා එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුවක් යටතේ ලබන වසරේ කාන්තා දිනයට පෙර කාන්තා අයිතීන් සුරැකීමේ ප්‍රඥප්ති නීතිගත කරන බවට ද ප්‍රතිඥා ලබා දුන්නේය.

එක්සත් ජාතික පක්‍ෂයේ දිගාමඩුල්ල දිස්ත්‍රික් ප්‍රධාන කාර්යාලයේ දී  මෙම බල මණ්ඩල රැස්වීම පැවැත්විණි.

අම්පාරේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ක්‍රියාකාරිහු පිරිසක් මෙහිදී විපක්‍ෂනායක රනිල් වික්‍රමසිංහ මහතා අතින් එක්සත් ජාතික පක්‍ෂයේ සාමාජිකත්වය ලබා ගත්හ.

එම රැස්වීමේ දී තවදුරටත් අදහස් දැක්වූ රනිල් වික්‍රමසිංහ මහතා මෙසේද පැවසීය.

2004 වසරේ බලයට පැමිණි එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව කාන්තා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට ක්‍රියා කළේ නැහැ. එපමණක් නොවේ, කාන්තාවන්ට හිමිවිය යුතුව තිබුණු සුබ සාධනයත් අහිමි කළා. කාන්තාවන්ගේ අයිතිවාසිකම් අහිමි කළ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආණ්ඩුව නැවත බලයට පත් නොකරන ලෙස මා රටේ සියලු කාන්තාවන්ගෙන් ඉල්ලා සිටිනවා.

2001 වසරේ බලයට පැමිණි එක්සත් ජාතික පෙරමුණ ආණ්ඩුව කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වන කෙටුම් පතක් සකස් කළා. එය ක්‍රියාත්මක කිරීම සඳහා විධායක අධිකාරියක් ද අප යෝජනා කොට තිබුණා. ඒ වැඩ පිළිවෙළින් කාන්තාවන් වෙනුවෙන් පුළුල් පියවර ගණනාවක් ගැනීමට සැලසුම් කොට තිබුණා. මෙය ක්‍රියාත්මක කිරීමට පෙර චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය එදා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා.

ඉන් අනතුරුව 2004 බලයට පත්වූ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව 2004 අප්‍රේල් 22 වැනි දා සිට 2010 වසරේ පෙබරවාරි මස 06 වන දා තෙක් එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළේ නැහැ.

ප්‍රාදේශීය සභාවල කාන්තා නියෝජනය 25% දක්වා වැඩි කළ යුතු බවට අප තීරණය කළා. නමුත් අද වෙන තෙක් ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සකසා නැහැ. ප්‍රචණ්ඩත්වයට ලක් වන කාන්තාවන් ඉන් ආරක්‍ෂා කර ගැනීම සඳහා නීති රීති සම්පාදනය කිරීමට අප සැලසුම් කොට තිබුණා. මේ වන තෙක් ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර නැහැ. එමෙන්ම රැකියා කරන කාන්තාවන්ට පිරිමින්ට මෙන් සම වැටුප් ලබා දීමට අප තීරණය කර තිබුණා. මැද පෙරදිග රැකියාවල නියුතු කාන්තාවන් වෙනුවෙන් ද අප යෝජනා කර තිබූ වැඩසටහන් එකක්වත් මේ ආණ්ඩුව ක්‍රියාත්මක කළේ නැහැ.

ගත වූ වසර 6 ක පාලන කාලය තුළ කාන්තා ප්‍රශ්න අමතක කර දැමූ සන්ධාන මන්ත්‍රීවරුන් මේ මැතිවරණයේ දී අමතක කර දමන ලෙස මා මේ රටේ කාන්තාවන්ගෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය පාලන කාලය තුළ කාන්තාවන්ට තිබූ ප්‍රචණ්ඩත්වය වර්ධනය වී තිබෙනවා. ත්‍රස්තවාදය නොමැති නිසා ඕනෑම අයෙකුට බියෙන් සැකෙන් තොරව ගමන් කිරීමට හැකි බව මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිවරයා ප්‍රකාශ කළත් අද මේ රටේ කාන්තාවකට නිදහසේ ගමන් කිරීමට පරිසරයක් ඇත්තේ නැහැ.

කුස්සියේ යුද්ධය උග්‍ර තත්ත්වයට පත්ව තිබීම නිසා තවත් පැත්තකින් අද කාන්තාවන් අර්බුදයකට මුහුණ පා සිටිනවා. දිනපතා ඉහළ යන බඩු මිල හමුවේ කාන්තාවන් මෙන්ම රටේ සමස්ත ජනතාව දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටිනවා.

එදා කිරි වීදුරුවක් පානය කොට පාසල් ගිය දරුවාට අද ඒ කිරි වීදුරුව ලබා දීමට දෙමාපියන්ට හැකියාවක් නැහැ. ආහාර ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් සියලුම භාණ්ඩවල මිල අසීමිත ලෙස ඉහළ ගොස් තිබෙනවා. බස්වල බෝම්බ පිපිරෙන්නේ නැති බව මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිවරයා ප්‍රකාශ කළත්, ඔහුගේ ආණ්ඩුවේ අදක්‍ෂ පාලනය නිසා රටේ නිවාස ලක්‍ෂ 40 ක කුස්සියේ බෝම්බ පිපිරෙනවා.

බඩු මිල ඉහළ යෑම දරාගත නොහැකිව ජනතාව සියදිවි නසා ගන්නා තත්ත්වයකට අද පත්ව සිටිනවා. ඇතැම් දෙමාපියෝ තම දරුවන් පවා විකුණන තත්ත්වයක් උදා වෙලා. බඩු

මිල වැඩිවීම පිළිබඳව මා ඔබට අමුතුවෙන් කිව යුතු නැහැ. මේ වන විට ජීවන වියදම 100% කින් වැඩි වී තිබෙනවා. නමුත් ආදායම වැඩිවී නැහැ.

කාන්තාවන්ගේ පහසුව සඳහා රටේ සෑම නිවසකටම පානීය ජල පහසුකම් ලබාදීමට 1977 බලයට පැමිණි ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව වැඩපිළිවෙලක් ආරම්භ කළා. ඒ වැඩපිළිවෙළ ඊට පසු බලයට පැමිණි ආණ්ඩු විසින් ද ඉදිරියට ගෙන ගියා. නමුත් මහින්ද රාජපක්ෂගේ "මහින්ද චින්තනයෙන්" 2009 වසරේ පානීය ජලය සඳහා වෙන් කළ මුදල් කපා හැර තිබෙනවා.

2008 වසරේ පානීය ජලය වෙනුවෙන් රුපියල් කෝටි 2500 ක් වෙන් කළා. 2009 වසරේ එය කෝටි 2200 දක්වා අඩු කොට තිබෙනවා. මේ තත්ත්වය නිසා කාන්තාවන්ට තවමත් වතුර කල හිසමත තබාගෙන නිවෙස් වෙත ගෙන ඒමට සිදුවී තිබෙනවා.

දුප්පත් පවුල්වල කාන්තාවන්ට සමෘද්ධි සහනාධාරය ඔවුන්ගේ පවුල් ඉදිරියට ගෙන යෑම සඳහා සෘජුවම බලපානවා. නමුත් මහින්ද රාජපක්ෂගේ මහින්ද චින්තනයෙන් ඒ සමෘද්ධි සහනාධාරය ද කප්පාදු කොට තිබෙනවා.

2008 වසරේ දී සමෘද්ධි සහනාධාරය සඳහා රුපියල් කෝටි දහසක් වෙන් කොට තිබෙනවා. නමුත් 2009 වසරේ දී එය රුපියල් කෝටි 930 දක්වා අඩු කර තිබෙනවා. මේක තමයි මහින්ද රාජපක්ෂ මහින්ද චින්තනය මගින් දුප්පත් ජනතාවට ලබා දී තිබෙන තෑග්ග.

කෘෂි කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් 2008 වසරේ කෝටි 1500 ක් වෙන් කළත් අපි වවමු රට නඟමු කියන මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 2009 වසරේ දී එය කෝටි 1200 දක්වා අඩු කොට තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව සඳහා මුදල් වෙන් කිරීම ද 26% කින් අඩු කර තිබෙනවා. සෞඛ්‍ය සේවය ආයෝජනය 32% කින් අඩු කළා.

මේ සියලු අංශවලට වෙන් කරන මුදල් කප්පාදු කළ ද මහින්ද චින්තනය මගින් මහාමාර්ග සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය 35% දක්වා වැඩි කළා. එය 2008 වසරේ රුපියල් කෝටි 6300 යි. 2009 වසරේ කෝටි 8600 ය දක්වා වැඩි කළා.

එපමණක් නොවේ වරාය හා ගුවන් සේවා කටයුතුවලට වෙන් කළ මුදල් 149% කින් වැඩි කළා. ජනතා සුභ සාධනය වෙනුවෙන් වෙන් කරන මුදල් කප්පාදු කළ සන්ධාන ආණ්ඩුව කොමිස් ලබා ගන්නා ක්ෂේත්‍රවලට මුදල් වෙන් කිරීම වැඩි කොට ඒ ක්ෂේත්‍ර ශක්තිමත් කළා.

මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව දැන් දේශීයත්වය ඉදිරියට ගෙන යන බව පෙන්වනවා. ඉංග්‍රීසි ආණ්ඩුව පන්නා දැමූ මේ අය දැන් එච්.එස්.බී.සී. බැංකුවට රට භාරදී තිබෙනවා. 2007 වසරේ සිට විශාල වශයෙන් ගිනි පොලියට මෙම බැංකුවෙන් ණය ලබාගෙන තිබෙනවා. අද වන විට ඒ ණය ගෙවා දැමීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබෙනවා.

රටේ අය-වැය ලේඛණය සකස් කිරීමට සිදුව තිබෙන්නේ එච්.එස්.බී.සී. බැංකුව කියන ආකාරයටයි. මෙම බැංකුවෙන් ලබාගත් ණය පියවීමට නොහැකි නිසා ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් තවත් ණයක් ලබා ගත්තා. ඒ අනුව ආණ්ඩුව දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට ද යටත් වී සිටිනවා.

වියදම් අඩු කරන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දිගින් දිගටම ආණ්ඩුවෙන් ඉල්ලා සිටියත් එච්.එස්.බී.සී. බැංකුව කියා සිටින්නේ අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවලට වෙන් කරන ලද මුදල් කපා හරින ලෙසයි.

එච්.එස්.බී.සී. බැංකුවට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ආපසු ගෙවා ගත නොහැකි ආකාරයට ආණ්ඩුව ණය වී සිටිනවා. දේශියත්වය ගැන කතා කළ මේ ආණ්ඩුව අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ එච්.එස්.බී.සී. බැංකුව දේශප්‍රේමීන් බවට පත් කොට තිබෙනවා.

පසුගිය වසරේ රටේ ණය වාරික සහ පොලිය ගෙවීමට පමණක් රුපියල් කෝටි අසූ දෙදහස් හරසියක් වැය වී තිබෙනවා. නමුත් රජයේ සමස්ත ආදායම රුපියල් කෝටි හැත්තදහසයි. මෙලෙස වැඩි පුර ගෙවිය යුතු රුපියල් කෝටි 12400 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීමට සිදු වූ බව ආණ්ඩුව ප්‍රකාශ කළා.

එපමණක් නොවේ සංවර්ධනය, වැටුප් හා සහනාධාර වෙනුවෙන් තවත් කෝටි 67200 ක් වැය කොට තිබෙනවා.

සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා මුදල් ආයෝජනය කිරීමෙන් එච්.එස්.බී.සී. බැංකුවෙන් කිසිදු වාසියක් ලැබෙන්නේ නැහැ. මේ බැංකුවට වාසියක් ලැබෙන්නේ මාර්ග ඉඳි වුණොත් පමණයි. ඒ මාර්ග හදන්නේ විශාල සමාගම් විසිනුයි. ඒ සඳහා එම සමාගම් එච්.එස්.බී.සී. බැංකුවෙන් ණය ලබා ගන්නවා. ඒ අනුව එච්.එස්.බී.සී. බැංකුව දිගින් දිගටම ඉල්ලා සිටින්නේ සෞඛ්‍ය හා අධ්‍යාපනය වෙනුවෙන් වැය වන මුදල් කප්පාදු කරන ලෙසයි. ඒ යෝජනාව එහෙයි ස්වාමීනි

කියමින් මහ බැංකුවේ අධිපති සහ මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා මුදල් කපා හරිනවා. මෙලෙස අසීමිත ලෙස අප ණය කරුවන් කොට ඇති එච්.එස්.බී.සී. බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය උගුලෙන් අප බේරිය යුතුයි. එසේ නොමැති නම් මේ රට ඉදිරියට ගෙන යාමට නොහැකියි.

මේ රටේ කාන්තා අයිතිවාසිකම් තහවුරු කළ හැක්කේ එක්සත් ජාතික පෙරමුණ ආණ්ඩුවකට පමණයි. සන්ධාන ආණ්ඩුවේ මහින්ද චින්තනය යටතේ කාන්තා ප්‍රශ්න අමතක කළත් අප ඒ ප්‍රශ්න කිසිදාක අමතක කර නැහැ. කාන්තාවන් වෙනුවෙන් විශේෂිත වූ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට අප සැලසුම් කොට තිබෙනවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශය ඊළඟ වසරේ කාන්තා දිනයට පෙර නීතිගත කිරීම අපේ අරමුණයි.

මෙම සියලු කටයුතු ඉදිරියට ගෙන යන අතරතුර රටේ ආර්ථිකය ගොඩනැඟීම අපේ අරමුණයි. නමුත් නැවත පටි තද කර ගන්නා ලෙස මා ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ නැහැ. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් අඩු කිරීමට අප සැලසුම් කොට තිබෙනවා. ඉදිරි මැතිවරණය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඒ වැඩපිළිවෙළ ඇතුළත් කොට තිබෙනවා.

රාජ්‍ය සේවකයන්ගේ සේම පෞද්ගලික අංශයේ සේවකයින්ගේ ද වැටුප් වැඩි කිරීම අපේ අරමුණයි. එලෙස වැටුප් වැඩි නොකළහොත් පවතින ජීවන වියදමට මුහුණ දීමට ජනතාවට හැකි වන්නේ නැහැ.

නිශ්චිත කාල සීමාවක් තුළ රටේ සමස්ත පාසල් පද්ධතිය දියුණු කරනවා සේම සෞඛ්‍ය ක්ෂේත්‍රය ද දියුණු කිරීමට අදාළ සැලසුම් මේ වන විටත් අප සකස් කොට තිබෙනවා. එපමණක් නොවේ ගොවීන්ට, ධීවරයින්ට සහ අනෙකුත් ක්ෂේත්‍රවල නිෂ්පාදනය සඳහා වැඩි මිලක් ලබා දීමේ ක්‍රියාමාර්ග වෙත අප යොමු වෙනවා.

මා අගමැතිවරයාව සිටිය දී ගොවි ජනතාවත්, පාරිභෝගිකයිනුත් ආරක්ෂා කරන සමබර සාධාරණ මිල ක්‍රමයක් ක්‍රියාත්මක කළා. ඒ වැඩපිළිවෙළ තුලින් ගොවීන්ට වැඩි ආදායමක් මෙන්ම පාරිභෝගිකයින්ට සහනයක් ලබාගැනීමට හැකි වුණා. අද ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක නොවීම නිසා ගොවීන් මෙන් ම පාරිභෝගිකයිනුත් අසරණ වී සිටිනවා.

රටේ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන්ට නව රැකියා අවස්ථා ලබාදීමේ වැඩපිළිවෙළක් ද අප ක්‍රියාත්මක කරනවා.

අද මේ රටේ ජනතාව බලා සිටින්නේ එක්සත් ජාතික පෙරමුණේ ආණ්ඩුවක් බලයට පත් කර ගැනීම සඳහායි. ඒ ආණ්ඩුව පත් කර ගැනීමට හැකි වන්නේ මනාප පොරය පසෙකලා අලියා ලකුණට ඡන්ද වැඩි කිරීමේ ව්‍යාපාරයේ නිරත වුණොත් පමණයි. ඒ අනුව අලියා ලකුණ ජයග්‍රහණය කරවීමට කැප වන ලෙස සියලු දෙනාගෙන් මා ඉල්ලා සිටිනවා.